**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 05/95**

මගේ අංකය: III/163/8/28/එල්/එල්/11
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු
අමාත්‍යාංශය , නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
1995 ජනවාරි මස 27 වෙනි දින

සියලුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්. ,

**<u>රාමසාන් සමයේ දී විශේෂ නිවාඩු ලබාදීම</u>**

1994 ජනවාරි මස 20 වැනි දින අංක 05/94 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට ඔබගේ අවධානය යොමු කරවමි.

02. 1995 වර්ෂයේ රාම්ලාන් (රාමසාන්) උත්සව සමයේදී මුස්ලිම් භක්තික රාජ්‍ය නිලධාරීන්ට/සේවකයින්ට යාඥ සහ ආගමික වතාවත්වල නිරත විය හැකිවන පරිදි වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

03. ආගමික සහ යාඥ කටයුතු දිනපතා සිදු කෙරෙන කාල වේලාවන් පහත දැක්වෙන පරිදි වේ.

- * පෙරවරු 3.00 සිට පෙරවරු 5.30 දක්වා
- * පෙරවරු 6.00 සිට පෙරවරු 7.00 දක්වා
- * පස්වරු 6.00 සිට පස්වරු 7.00 දක්වා
- * පස්වරු 8.00 සිට රාත්‍රි 10.00 දක්වා

04. මෙම කාලසීමාවක් තුලදී ආගමික වතාවත්වල යෙදීමට හැකිවන පරිදි සැමවිටම වැඩ මුර සකස් කර දිය යුතුය. එහෙත් අත්‍යාවශ්‍ය අවස්ථාවලදී විශේෂ නිවාඩු අනුමත කිරීම මැනවි.

05. තව ද 1995 රාම්ලාන් (රාමසාන්) අවසන්වීමේ දිනට දින 16 කට කලින් රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සුදුසුකම් ඇති මුස්ලිම් නිලධාරීන්ට/ සේවකයින්ට උත්සව අත්තිකාරම් මුදල් ලබාදීමට ද කටයුතු කිරීම මැනවි.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය